# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2464/14 - 2025 නොවැම්බර් මස 25 වැනි අඟහරුවාදා - 2025.11.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

1. 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය අනුර කුමාර දිසානායක වන මම, මෙහි උපලේඛනයේ (I) වන තීරුවේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන් එම උපලේඛනයේ (II) තීරුවේ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණය මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවනු ලබන අතර, එකී නියමය 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියේ විධිවිධානවලට යටත්ව 2025 නොවැම්බර් මස 26 වැනි දිනෙන් ආරම්භ වී 2025 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා බලාත්මක වේ.

උපලේඛනය

| *I වැනි තීරුව* | | | | *II වැනි තීරුව* |
|---|---|---|---|---|
| *වෙළඳ භාණ්ඩය* | | | | *විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද* |
| | *සං.ව. ශීර්ෂය* | *සං.ව. සංකේතාංකය* | *විස්තරය* | |
| 1. | 07.01 | 0701.90 | අනෙකුත් - අර්තාපල් | කි.ග්‍රෑමයට රු. 80.00 |
| 2. | 07.03 | 0703.10.20 | බොම්බයි ළූණු | කි.ග්‍රෑමයට රු. 50.00 |

2. 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි සහ 5 වැනි වගන්ති යටතේ 2024 දෙසැම්බර් මස 31 දිනැති අංක 2417/20 දරන *අති විශෙෂ ගැසට්* නිවේදනයෙහි උපලේඛනයේ අයිතම අංක 24 යටතේ දක්වා ඇති දෙමුහුන් වර්ගයේ මැන්ඩරින් (අනෙකුත් - අලුත්/ සංයෝජිත වර්ගීකරණ සංකේතය 0805.29.10) මත පනවන ලද විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද, 2025 නොවැම්බර් මස 26 වැනි දින සිට බලාත්මක වන පරිදි මෙයින් ඉවත් කරනු ලැබේ.

**අනුර කුමාර දිසානායක,**
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය.

2025 නොවැම්බර් මස 25 වැනි දින,
කොළඹ 01,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

EOG 11 - 0205


1A - PG 7370 — 428 (2025/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*